සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

සැකසුම - ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපය
ර/ඇඹි/හෙලඋඩකන්ද විද්‍යාලය

8 ශ්‍රේණිය - සිංහල | දෙවන වාරය | විසිඑක්වන සතිය

**13 වන පාඩම - වාක්‍ය රීති 1 (01 කොටස)**

- නිවැරදි වාක්‍ය ලිවීම සඳහා වාක්‍ය රීති මැනවින් ප්‍රගුණ කළ යුතුය.
- වාක්‍යයක උක්තය හා ආඛ්‍යාතය යනුවෙන් ප්‍රධාන කොටස් දෙකකි.
  - උදා: **මම** පාසල් **යමි**. (මෙහි **මම** යනු උක්තය වන අතර **යමි** යන්න අවසාන ක්‍රියාව හෙවත් ආඛ්‍යාතය වේ).
- මෙම උක්තය හා ආඛ්‍යාතය නිවැරදිව ගැළපීමෙන් නිවැරදි වාක්‍යයක් සෑදේ.
- වාක්‍යයක උක්තය සඳහා කිසියම් නාම පදයක් යොදා ගන්නා අතර එම නාම පද **ලිංග භේදය හා වචන භේදය** අනුව වෙනස් වේ.
- ලිංග භේදයට අනුව නාම පදයක් පුරුෂ ලිංග, ස්ත්‍රී ලිංග, නපුංසක ලිංග වශයෙන් කොටස් 3කි.

**ලිංග භේදය**

| **පුරුෂ ලිංග නාම පද** | **ස්ත්‍රී ලිංග නාම පද** | **නපුංසක ලිංග නාම පද** |
|---|---|---|
| විදුහල්පතිතුමා | විදුහල්පතිතුමිය | මේසය |
| ශිෂ්‍යයා | ශිෂ්‍යයාව | පුටුව |
| ගුරුතුමා | ගුරුතුමිය | ගස |
| තාත්තා | අම්මා | මල |

ක්‍රියාකාරකම:01. ඉහත සටහන සටහන් කර ගන්න.

02. පෙළ පොතේ 104, 105, 106 ,107 පිටු හොඳින් කියවන්න.

03. පෙළ පොතේ 106 වන පිටුවේ ඇති ලිඛිත අභ්‍යාසය කරන්න.